**ගාලු උරුමය පදනම - 2016**

**--------------------------------**

ගාලු උරුමය පදනමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනතේ 13(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ගාලු උරුමය පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත්, පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ගාලු උරුමය පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

--------------------------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උපචිත පදනම අනුගමනය කළ යුතු වුවද, ස්ථාවර තැන්පත් පොළී ආදායම මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 පරිදි මුදල් හා සමාන දෑ ලෙස නිශ්චිත මුදල් වටිනාකමකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටිකාලීන, ඉතා ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන ලෙස සැලකිය යුතු වුවත් මෙම ප්‍රමිතියට පටහැනිව පදනමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව වසර 3 ක ස්ථාවර තැන්පතු ආයෝජන, මුදල් හා සමාන දෑ ලෙස හඳුනාගෙන තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරුණු ලැබේ.

(අ) සිප්නාරා ආපනශාලාව බදු දීම වෙනුවෙන් 2015/2016 වර්ෂ සඳහා ලැබිය යුතු රු.78,400 ක බදු මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු ආදායම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) ශේෂ පිරික්සුමට අනුව රු.34,999,633 ක් වූ ගොඩනැගිලි වටිනාකම තුළ පදනමට අයත් දේපලක් නොවන කොටු පවුර සංරක්ෂණය හා වැඩි දියුණු කිරීම් සඳහා දරන ලද රු.32,664,052 ක් වූ වියදම් ඇතුළත් වන අතර මෙම වියදම්ද, ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂය රු.278,963 ක් ලෙස දක්වා තිබුණද, විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම් අනුව එම වටිනාකම රු.1,919,787 ක් වූයෙන් වර්ෂයේ ක්ෂය රු.1,640,824 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රධාන ලෙජරයේ ශේෂයන් හා ශේෂ පිරික්සුමේ ශේෂයන් අතර ලෙජර් ගිණුම් 20 කට අදාළව රු.3,667,218 ක වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ස්ථාවර වත්කම් | 38,915,163 | ස්ථාවර වත්කම් ලේඛන |
| (ආ) වෙනත් ලැබිය යුතු ගිණුම් | 1,194,048 | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් සඳහා උපලේඛන |
| (ඇ) වෙනත් ගෙවිය යුතු ගිණුම් | 1,889,242 | ශේෂ සනාථ සහතික<br>කාල විශ්ලේෂණ |

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සියළුම ජර්නල් සටහන් හා ඊට අදාළ ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර ගිණුම්කරණ පද්ධතිය තුළින්ද, පරීක්ෂා කිරීමට පහසුකම් කිසිවක් නොතිබුණි. ඒ අනුව ගිණුම්වල හා ජර්නල් සටහන්වල නිරවද්‍යභාවය පිළිබඳව විගණනයට ගැටළු සහගත විය.

## 2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2016 ඔක්තෝබර් 27 දින රු.12,000,000 ක් වූ වර්ෂ තුනකින් කල්පිරෙන නව ආයෝජන සිදු කර තිබුණද, ඒ සඳහා වූ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි 756 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව භාණ්ඩවල හරි වැරදි බැලීමට මෙන්ම පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ගැන වාර්තා කිරීමට වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කළ යුතු වුවද, පදනම විසින් 2013 වර්ෂයෙන් පසු ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එවැනි වත්කම්වල අගය රු.38,915,163 ක් විය.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,258,813 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,090,324 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,168,489 කින් වර්ධනය වී තිබුණි. අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රදාන රු.1,775,000 කින් වැඩි වීම, ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.545,882 ක්වූ අතිරික්තය 2013 වර්ෂයේදී රු.2,824,939 ක ඌනතාවයක් බවට පත් වී තිබුණු අතර 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමෙන් පසු පදනමේ දායකත්වය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ අඩු වී තිබුණු අතර 2014 වර්ෂයේදී රු.7,263,063 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වනවිට රු.11,151,762 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 පදනමට එරෙහිව හෝ පදනම විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---

2011 වර්ෂයේ තාවකාලිකව බඳවාගත් සේවිකාවක් සේවයෙන් ඉවත් කිරීමෙන් පසුව ඇය නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා පදනමට එරෙහිව කම්කරු උසාවියේ 2012 දෙසැම්බර් 21 දින නඩුවක් ගොනුකර තිබූ නමුත්, මේ සම්බන්ධව ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. මෙම නඩුව වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට නීතීඥ ගාස්තු වශයෙන් පදනම විසින් රු.120,000 ක් ගෙවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

1994 අංක 07 දරන ගාලු උරුමය පදනමේ පනතේ 03 වන වගන්තිය අනුව පදනමේ අරමුණු පහත දැක්වේ.

- ඓතිහාසික නගර මධ්‍යස්ථානයක් ලෙසද පුරා විද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙසද ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම , ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම.

- ගාලු කොටුවේ හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය ඇතුළත පිහිටියා වූ ද ඓතිහාසික සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති වූ ද යම් නිශ්චල හා චංචල දේපලක් අත්කර ගැනීම, දැරීම, පවත්වා ගෙන යාම සහ බැහැර කිරීම.

- ගාලු කොටුවේ හා ඓතිහාසික පසුබිම ඇතුළත පිහිටි නිවාස, ගොඩනැගිලි සහ වෙනත් දේපල සංරක්ෂණය කිරීමේහිලා ගාලු කොටුව තුළ පදිංචිකරුවන්ගේ උනන්දුව ප්‍රවර්ධනය කිරීම.

- ගාලු කොටුව සහ එහි ඓතිහාසික පසුබිම පශ්චාත් භූමියට ඇතුළු වී එහි සිරි නැරඹීම සඳහා පහසුකම් සැලැස්වීම.

- ගාලු කොටුව සහ එහි ඓතිහාසික පසුබිම පශ්චාත් භූමිය තුළ පදිංචිකරුවන්ගේ සාමාන්‍ය සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

- ඉහත කී අරමුණු සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියළු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

ඉහත අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොටු බැම්මේ ඇති කුටි කිහිපයක සහ තවත් ස්ථාන කිහිපයක කාලයක් තිස්සේ ඉවත් නොකරන ලද බෝතල් සහ අපද්‍රව්‍ය ගොඩ ගැසී තිබෙන බව හා කොටු පවුරේ යුධ කාමරයට ඉහළින් ඇති ඉහළ මහලට යාම සඳහා ඇති ප්‍රදේශය සෝදා පාළුවට ලක් වී විනාශ වෙමින් පැවතුණි.

(ආ) ගාලු කොටුව තුළ පිහිටි පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ගොස් තිබූ ගාලු උරුමය පදනමේ කාර්යාලය 2012 දෙසැම්බර් සිට මාසිකව රු.30,000 බැගින් කුළී ගෙවමින් ගාලු කොටුවෙන් බැහැර පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලකට ගෙන ගොස් තිබුණි. කොටුවේ සහ එහි ඓතිහාසික භූමියෙහි කටයුතු පවත්වා ගෙන යාමට එය බාධාවක්ව පැවතුණි.

(ඇ) තොරතුරු මධ්‍යස්ථානයේ ආදායම ඉකුත් වර්ෂයේදී රු.52,929 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී රු.32,480 ක් දක්වා රු.20,449 කින් අඩු වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරුණු ලැබේ.

(අ) පදනමට වැඩි බලතල හිමිකර ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම යන අරමුණු වෙනුවෙන් 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, 2017 ඔක්තෝබර් වන විටත් එම පනතේ සංශෝධන කටයුතු සිදු වී නොතිබුණි.

(ආ) 2015 මුල් කාර්තුවේදී සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් යුනෙස්කෝ සංවිධානය වෙත ලෝක උරුම ගාලු කොටුව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් සංරක්ෂණ සැලසුම් හා ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීමට අදාළව පදනම වෙත පැවරී ඇති කාර්යභාර්ය, වගකීම් හා පදනමේ සිදු කළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් පදනම කටයුතු කර නොතිබුණි.

(ඇ) යුනෙස්කෝ සංවිධානය විසින් ගාලු කොටුව ලෝක උරුමයක් ලෙස නම් කර තිබූ අතර, ඒ අනුව ගාලු කොටුව ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය වෙත ඉදිරිපත් කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහ යුනෙස්කෝ සංවිධානයේ මගපෙන්වීම් (guideline) වලට අනුකූලව කටයුතු කිරීමට ගාලු උරුමය පදනමේ කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඈ) 17 වන සියවසේ මුල් අවධියට අයත් ගාලු කොටුවේ දැනට තැපැල් කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ වර්ග අඩි 1500 ක පමණ සංරක්ෂණය නොකළ කොටසේ වහලය වර්ෂ 06 ක පමණ සිට සම්පූර්ණයෙන් දිරාපත් වී තිබුණි. මෙම ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඉ) ගාලු කොටුව තුළ සිදු විය හැකි සදාචාර හානි හා වෙනත් විනාශ කිරීම් වැලැක්වීමේ අරමුණින් 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව සුභ සාධන පහසුකම් හා යටිතල පහසුකම් නගා සිටුවීම යටතේ සීසීටීවී පද්ධතියක් ස්ථාපිත කිරීමට නියමිතව තිබූ නමුත්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ගාල්ල - කොටුව තුළ දැනට හඳුනා ගෙන ඇති අනවසර ඉදිකිරීම් 28 ක් අතරින් ස්ථාන 06 ක් සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබූ අතර ඉතිරි අනවසර ඉදිකිරීම් 22 සම්බන්ධව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගැනීමට කළමනාකරණ මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගාලු උරුමය පදනම විසින් "සිජ්නාරා" ආපනශාලාව 2015 සැප්තැම්බර් 01 වන දින සිට 2016 අගෝස්තු මස 31 වන දින දක්වා රු.50,000 ක මාසික බදු කුළියක් යටතේ බදු දී තිබුණද, බදුකරු විසින් කුලී නොගෙවීම නිසා රු.600,000 ක ආදායමක් ගාලු උරුමය පදනමට අහිමි වී තිබුණි.

(ආ) ආයතනයේ දත්ත ඇතුළත් කිරීම සඳහා ඩැක් ඊසී ගිණුම්කරණ පද්ධතිය 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා භාවිතා කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඩැක් ඊසී ගිණුම්කරණ පද්ධතිය නිවැරදිව භාවිතා කර නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------------

ගාලු කොටුව ඔරලෝසු කණුව අළුත්වැඩියාව අදියර 2 ක් යටතේ රු.9,203,781 ක ඇස්තමේන්තුවකට ඔරලෝසු කණුව ඇතුළත අළුත්වැඩියා කටයුතු, දැවමය පඩිපෙළ අළුත්වැඩියාව සහ විදුලි වැඩ කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කර තිබූ අතර , මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණ කරනු ලැබේ.

(අ) පළමු වන අදියර යටතේ රු.5,520,478 ක් වැය කර ඔරලෝසු කණුව ඇතුළතට ජලය කාන්දු වීම වැලැක්වීම සඳහා අළුත්වැඩියා කටයුතු කර තිබුණද වැසි පවතින අවස්ථාවලදී ඔරලෝසු කණුව ඇතුළතට ජලය ගලා ඒමෙන් බිත්ති විනාශ වෙමින් පවතින බව 2017 ඔක්තෝබර් 11 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ඇස්තමේන්තුවේ වැඩ විෂයය B – 2 යටතේ දැවමය පඩිපෙලෙහි දිරාපත් වී ඇති කොටස් ඉවත්කර අලුතින් පළමු පන්තියේ දැව යොදා අලුත්වැඩියා සිදුකර දැව ආලේපන තීන්ත ආලේප කිරීමට (Water Base) රු.340,800 ක් ඇස්තමේන්තුකර ගෙවීම්කර තිබුණද එහිදි සිදුකර පැවතියේ පවතින පඩිපෙල සඳහා තීන්ත ආලේප කිරීම පමණක් බව නිරීක්ෂණය විය.

(ඇ) ගාල්ල කොටුව ඔරලෝසු කණුව අලුත්වැඩියා කටයුතු සඳහා අදාළ ඇස්තමේන්තුවේ වැඩ විෂයය E යටතේ විදුලි වැඩ වෙනුවෙන් (Electrical Works) රු.1,519,320 ක් ඇස්තමේන්තු කර රු.1,331,865 ක වියදමක් 2016 වර්ෂයේ දරා තිබුණද, 2017 ඔක්තෝබර් 11 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂා අවස්ථාව වනවිට එහි විදුලි පද්ධතිය අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

**4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති**

ගාලු කොටුවේ පවතින සඳු අට්ටාලයේ යුධ කාමරය යටත් විජිත ඉතිහාසය සහිත ප්‍රදර්ශන මැදිරියක් බවට පත් කිරීමේ කාර්යය 2012 වර්ෂයේ ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.11,340,426 ක් වැයකර පැවතියද ප්‍රදර්ශන මැදිරියේ කටයුතු අවසන්ව නොතිබුණි. මේ හේතුවෙන් 2014 වර්ෂය වනවිට රු.3,180,000 ක් වැයකර ලබාගෙන තිබුණු මූර්ති 12 ක් සහ රු.1,520,000 ක් වැයකර ලබාගෙන තිබූ චිත්‍ර 16 ක් ප්‍රදර්ශන මැදිරිය තුළ ස්ථානගත කිරීමට නොහැකිව වසර 03 කාලයක් තිස්සේ තොරතුරු මධ්‍යස්ථානය තුළ තබා තිබුණි. එමෙන්ම 2015 වර්ෂයේදී රු.684,351 ක් වැයකර ප්‍රදර්ශන මැදිරිය තුළ සවිකර පැවති වායු සමීකරණ යන්ත්‍ර 02 කද විගණන අවස්ථාව වූ 2017 සැප්තැම්බර් වනවිට ක්‍රියාවිරහිතව පැවතුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගාලු උරුමය පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 19 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 08 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයට අයත් පදනමේ අධ්‍යක්ෂ තනතුර සඳහා 2007 අප්‍රේල් 11 දින සිට විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරයෙක් ද පරිපාලන නිලධාරී තනතුර සඳහා 2006 ජනවාරි 03 සිට විශ්‍රාමික නිලධාරිනියක්ද, වාර්ෂිකව කාලය දීර්ඝ කරමින් කොන්ත්‍රාත් පදනම මත පත් කර තිබුණි.

(ආ) සංවර්ධන සහකාර තනතුරු 03 ක් සඳහා සංස්කෘතික අමාත්‍යාංශයේ සංස්කෘතික නිලධාරීන් 03 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර ස්ථිර කාර්ය මණ්ඩලයක් පත් නොකිරීම හා පවතින පුරප්පාඩු හේතුවෙන් සංරක්ෂණ ව්‍යාපෘති සහ නව ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හා අනුමත කළමනාකරණ සැලැස්මට අනුගතවීමට නොහැකිවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

2005 ජනවාරි 27 දිනැති අංක පීඊඩී 27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ගාලු උරුමය පදනම සිය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2017 සැප්තැම්බර් 29 දින දීය.

**5.2 විගණන කමිටු**

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාර, සෑම වසරකම ත්‍රෛමාසිකව විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, ගාලු උරුමය පදනම විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

**5.3 ක්‍රියාකාරි සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු දක්වා තිබුණද, එම අරමුණු ඉටුකර ගැනීමට අදාළ ව්‍යාපෘති හා ප්‍රධාන ක්‍රියාකාරකම් පැහැදිලිව හඳුනාගත හැකි පරිදි දක්වා නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර විගණන විමසුම් මගින් පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| | (ii) | ස්ථාවර වත්කම් ගිණුම් තැබීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබීම. |
| | (iii) | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වර්ෂ අවසානයේ භෞතික පරීක්ෂණයක් සිදු කර නොතිබීම. |
| | (iv) | ප්‍රාග්ධනිත කළ නොහැකි වියදම් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කිරීම. |
| (ආ) ගිණුම්කරණය | (i) | වත්කම් නියමිත පරිදි වර්ගීකරණය නොකිරීම. |
| | (ii) | ශේෂ පිරික්සුමේ හා ලෙජරයේ වෙනස්කම් පැවතීම. |
| | (iii) | ජර්නල් වවුචර් හා ඊට අදාළ ලේඛන ඉදිරිපත් නොවීම. |
| | (iv) | ගිණුමේ හෙළිදරව් කර ඇති ක්ෂය අනුපාත අනුව ක්ෂය ගණනය කර නොතිබීම. |
| (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | (i) | හිඟකුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | (ii) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්වල උපලේඛන ඉදිරිපත් නොකිරීම. |